**මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය**

දෙවන වාර පරීක්ෂණය - 2025

9 ශ්‍රේණිය

**නර්තනය**

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2 යි

**I කොටස**

- **අංක 01 - 05 දක්වා ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. සබරගමුව නර්තන සම්ප්‍රදායේ පාසරඹ හඳුන්වනු ලබන්නේ,
   i. දොමිත පද
   ii. මණ්ඩි පද
   iii. සුරල් පද
   iv. සරඹ පද
2. පා සරඹ නර්තනය කිරීමෙන් අනතුරුව උඩරට නර්තන ආධුනිකයා ප්‍රගුණ කරන සරඹ විශේෂය වන්නේ,
   i. ඉලංගම් සරඹ
   ii. මණ්ඩි සරඹ
   iii. ගොඩ සරඹ
   iv. දොමිත පද
3. සමගුණ ලෙස හඳුන්වන්නේ,
   i. විලම්භ ලය
   ii. මධ්‍ය ලය
   iii. ද්‍රැත ලය
   iv. ත්‍රිවිධ ලය
4. දේශීය නර්තන සම්ප්‍රදායන් තුනටම පොදු වූ ශාන්ති කර්මය වන්නේ,
   i. දෙවොල් මඩුව
   ii. පහන් මඩුව
   iii. කොහොඹා කංකාරිය
   iv. බලිශාන්ති කර්මය
5. හිසේ සිට පාදාන්තය දක්වා දොස් දුරු කිරීමේ අරමුණින් ගායනා කරන කවි විශේෂය
   i. පතුරු කවි
   ii. සිරසපාද කවි
   iii. කඩතුරා කවි
   iv. මල්යහන් කවි
6. ''සඳවට තුරුවැල් ඇවිදින් කළඑළි සද්දේ........''මෙම කවිය
   i. සවරම් කවි
   ii. කඩතුරා කවි
   iii. කඩතුරා කවි
   iv. කඩුහරඹ කවි
7. මුහුණේ භාව ප්‍රකාශනය තුළින් අදහස් ප්‍රකාශ කිරීම
   i. ආංගික අභිනය
   ii. සාත්වික අභිනය
   iii. වාචික අභිනය
   iv. ආහාර්ය අභිනය

8. වන්නම් නර්තනයේදී භාවිත චලන විශේෂය වන්නේ,

i. ප්‍රකාශනාත්මක චලන
ii. රිද්මයානුකූල චලන
iii. භාව චලන
iv. තාලානුකූලව චලන

9. මැදුම් තනි තිතට අයත් වන්නමක් වන්නේ,

i. සිංහරාජ වන්නම
ii. සැවුලා වන්නම
iii. හනුමා වන්නම
iv. වෛරොඩි වන්නම

10. ගැට බෙරයේ දකුණු ඇස ආරක්ෂාවට යොදා ගනු ලබන්නේ,

i. සුරත් තට්ටුව
ii. වෙනිවර කැරැල්ල
iii. කැපුම්හම
iv. හැත්ම

11. සිංහරාජ වන්නම අයත් තාල රූපය වන්නේ,

i. මාත්‍රා 2+2
ii. මාත්‍රා 3+3
iii. මාත්‍රා 2+3
iv. මාත්‍රා 4+4

12. උඩරට වන්නමක කොටස් ගණන,

i. තුනකි
ii. හතරකි
iii. හයකි
iv. පහකි

13. ගැමි පරිසරයේ ප්‍රචලිත ගැමි කතාවක් ඇසුරු කොට ගනිමින් නිර්මාණය වූ උඩරට වන්නමකි

i. හනුමා වන්නම
ii. වෛරොඩි වන්නම
iii. සිංහරාජ වන්නම
iv. සැවුලා වන්නම

14. ''දොං ජිංත ගත දොංත''යන බෙර පදය අයත් වන්නම වන්නේ,

i. හනුමා වන්නම
ii. තුරඟා වන්නම
iii. සැවුලා වන්නම
iv. වෛරොඩි වන්නම

15. ගායනයක් සමගම තිත ආරම්භ වීම

i. අවග්‍රහ
ii. සමග්‍රහ
iii. විෂමග්‍රහ
iv. ග්‍රහ පන්ති

16. ශාන්ති කර්මවල දී භාවිත පොදු චාරිත්‍ර විධියක් නොවන්නේ,

i. කප් සිටුවීම
ii. වාහල නර්තනය
iii. මඩුපේ කිරීම
iv. තොට පේ කිරීම

17. උඩරට වන්නම් රචනා වී ඇත්තේ,

i. ගම්පොළ යුගයේදී
ii. මහනුවර යුගයේදී
iii. කොළඹ යුගයේදී
iv. කෝට්ටේ යුගයේදී

18. ත්‍රිවිධ ලය භාවිතයට නොගන්නා අවස්ථාවකි

i. පා සරඹ නර්තනයේදී
ii. වන්නම් නර්තනයේදී
iii. බෙර සරඹ වාදනයේදී
iv. ගොඩ සරඹ වාදනයේදී

19. වෘත්තීන් හා සම්බන්ධ ගැමි නැටුමකි

i. පන් නෙළීම
ii. සවරම්
iii. ලී කෙළි
iv. රබන්

20. පුරා වෘත්ත කතාවක් සමාන ශාන්ති කර්ම දෙක වන්නේ,

i. කොහොඹා කංකාරිය, යක් ඇනුම
ii. දෙවොල්මඩුව, පහන් මඩුව
iii. දෙවොල්මඩුව, කොහොඹා කංකාරිය
iv. කොහොඹා කංකාරිය

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

1.

i. ගැටබෙරය සකස් කිරීමට ගන්නා දැව වර්ග 02ක් නම් කරන්න.
ii. ගැටබෙරයේ ඇති සුවිශේෂී ලක්ෂණ 02ක් ලියන්න.
iii. ගැටබෙරයේ රූපසටහනක් ඇඳ කොටස් නම් කරන්න.

(ල. 12)

2.

i. මාත්‍රා 4+4 අයත් බෙරපදයක් ප්‍රස්තාර කරන්න.
ii. ''අගය වඩන කවි වරුණා'' යන කවි පදය මාත්‍රා 3+3 තිතට ප්‍රස්තාර කරන්න.

(ල. 12)

3.

i. පන් නෙළීමේ කවියක් ලියන්න.
ii. ගැමි නැටුමක දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ 03ක් ලියා එකක් පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
iii. ගැමි නැටුමකට අදාළ රංග භාණ්ඩයක් නිර්මාණය කරගන්නා ආකාරය කෙටියෙන් ලියන්න.

(ල.12)

4.

i. අනුරාධපුරයට අයත් සෙල්ලිපි දෙකක් නම් කරන්න.
ii. එක් සෙල්ලිපියකට අයත් කරුණක් දක්වන්න.
iii. කෝට්ටේ යුගයට අයත් සන්දේශ කාව්‍යයක කවියක් ලියන්න.

(ල.12)

5.

i. ද්‍රවිඩ ගැමි නැටුම් දෙකක් ලියන්න.

ii. එම නර්තනයට සමාන සිංහල ජන නැටුම් දෙකක් විස්තර කරන්න.

iii. ද්‍රවිඩ හා සිංහල ජන නැටුම් වල සමාන හා අසමානතා 02ක බැගින් ලියන්න.

(ල.12)

6.

i. ශාරීරික ස්වස්ථතාවය පවත්වා ගැනීම සඳහා ස්වස්ථතාවය කෙරෙහ බලපාන ප්‍රධාන සාධක 02 ලියන්න.

ii. නර්තන කලාව හැදෑරීමෙන් ශිෂ්‍යයෙකුට ඇතිවිය හැකි ගුණාංග පිළිබඳ විස්තර කරන්න.

(ල.12)